www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජී-20 සමුලුවෙන් පසුවත් මහා බලවතුන් අතර බෙදීම් දිග් ගැස්සෙයි

## Great Power divisions persist following G20 summit

**ස්ටෙෆර්න් ස්ටේන්බර්ග් විසිනි**
**2009 මාර්තු 16**

වර්ධනය වන ජාත්‍යන්තර මූල්‍ය අර්බුදයට මුහුන දීම සඳහා ගත යුතු පියවර පිලිබඳව කිසිදු සංයුක්ත එකඟතාවයකින් තොරව ම, ජී-20 මුදල් ඇමතිවරුන්ගේ හා මධ්‍යම බැංකුකරුවන්ගේ සමුලුව නිමාවට පත් විය.

ලෝක ආර්ථික නිමැවුමෙන් සියයට 85 කට වගකියන ලොව ප්‍රමුඛ ආර්ථිකයන්හි මුදල් ඇමතිවරු හා මධ්‍යම බැංකු කරුවන් එකට එක්කල රැස්වීමක්, මාර්තු 13 හා 14 දෙදින තුල දකුනු එංගලන්තයේ හොර්සැම්හි දී පැවත්වින. රැස්වීමේ අරමුන වූයේ අප්‍රේල් 02 දින ලංඩන්හි දී පැවැත්වීමට නියමිත ජී-20 රාජ්‍ය නායක සමුලුව සඳහා න්‍යාය පත්‍රයක් සකස් කිරීමයි.

ලෝක ආර්ථිකයන් පිලිබඳව සලකන කල පරදුවට තැබී ඇත්තේ කුමක්දැයි අවධාරනය කල, ලෝක බැංකු සභාපති රොබට් සොඑලික්ගේ අනතුරු ඇඟවීමකින් රැස්වීම ආරම්භ විය. ඔහු මෙසේ සඳහන් කලේය. ''2009 අතිශයින්ම භයානක වසර බවට පත්වෙමින් තිබේ. දුෂ්කරතා 2010 දක්වා ද දිග් ගැස්සිය හැකිය. අන්තරාය වන්නේ, ඉතා ප්‍රමාදවී ඉතා සුලු දෙයක් පමනක් කිරීමට ඉතිරිව තිබීමයි.'' මේ වසර තුල ලෝක ආර්ථිකය සියයට 1.2 න් හැකිලී යනු ඇතැයි ලෝක බැංකුව ගනන් බලා ඇත.

දෙදින සමුලුවෙන් පසුව එහි අනුග්‍රාහකයන් වූ බ්‍රිතාන්‍ය අගමැති ගෝර්ඩන් බ්‍රවුන් හා ඔහුගේ මුදල් ඇමති ඇලිස්ටෙයා ඩාර්ලිං, ඉතාම වාසිදායක එලියකින් යුක්තව සිය තක්සේරුව ඉදිරිපත් කිරීමට උත්සුක වූහ. එහෙත් රැස්වීමෙන් අර්බුදයට විසඳුම් ලෙස, සංයුක්ත ප්‍රතිපත්ති හෝ තීන්දු කිසිවක් එලි දැක්වුනේ නැත. අවසන් ප්‍රකාශනයෙන් ඉටු වූයේ, මැදිහත්වූ විවිධ රටවල් අතර ආර්ථික පිලිවෙත මත දිග් ගැස්සෙමින් ඇති බෙදීම් යට ගැසීමයි.

රැස්වීමේ න්‍යායපත්‍රයට ඇතුලත් ප්‍රධාන ප්‍රශ්න තුනක් විය. ඒ, ප්‍රමුඛ ආර්ථික බලවතුන් විසින්, එක දිගට වැටෙමින් ඇති ආර්ථිකයන් පන ගැන්වීම හා බැංකු ගලවා ගැනීමේ තවත් දැවැන්ත උත්තේජක වැඩ සටහන් ක්‍රියාවට නැගීම, මූල්‍ය වෙලඳපලවල් පරිපාලනය හා බංකොලොත්වීමේ අවදානමට මුහුනපා ඇති රටවල් බේරා ගැනීමට මැදිහත් වීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ඉඩ සැලසෙන පරිදි එහි අරමුදල් තර කිරීමයි.

මුදල් ඇමතිවරු හා මහ බැංකු අධිපතීන් නිකුත් කල ශුභවාදී ප්‍රකාශනය තුල මෙසේ සඳහන් විය. ''ඉල්ලුම හා රැකියා ප්‍රවර්ධනය සඳහා තීරනාත්මක හා මනාව සම්බන්ධීකරනය කල පියවර අප විසින් ගෙන ඇති අතර, වර්ධනය ස්ථාපිත කරන තෙක් අවශ්‍ය කුමන හෝ ක්‍රියාවකට අත ගැසීමට අපි සූදානම්ව සිටින්නෙමු. සියලු වර්ගයේ ආරක්ෂනවාදයන්ට එරෙහිව සටන් වැදීමට අපි කැපවන  අතර, විවෘත වෙලඳම හා ආයෝජන ක්‍රියාවලිය දිගට ම පවත්වා ගන්නෙමු.''

ප්‍රකාශනය සමීප ලෙස සමාලෝචනය කිරීමේ දී හෙලිවන්නේ, සහභාගී වූ මුදල් ඇමතිවරු හා බැංකු කරුවෝ කිසිදු මූලික ප්‍රශ්නයක දී එකඟතාවයකට පැමිනීමට අපොසත්ව ඇති බවයි.

ප්‍රමුඛ ජාතීන් විසින් නව උත්තේජක වැඩ සටහනක් සඳහා එකඟතාවකට පැමින නැත. ජාතික තීන්දු ගැනීමේ හා ප්‍රමුඛතා පෙල ගැස්වීමේ අයිතිය ඔවුන් වෙත තබාගෙන ඇත. මූල්‍ය වෙලඳපොල පරිපාලනය පිලිබඳ ප්‍රකාශනයේ අදාල ඡේදය තුලදී, ''සවිමත් පරිපාලනය, ප්‍රමාද දෝෂයන් විචක්ෂන ලෙස මගහරවා ගැනීම හා ප්‍රබල ජාත්‍යන්තර සහයෝගීතාවයක'' අවශ්‍යතාවය අවධාරනය කර තිබුන ද වැඩි වර්ධනය කල පරිපාලනය ක්‍රියාත්මක කල හැකි නව ජාත්‍යන්තර ආයතනයක් ගොඩනැගීම පිලිබඳව එකඟතාවයකට පැමිනීමට ඔවුන් අසමත් විය.

ජාමූඅ අරමුදල් වැඩිකිරීම සම්බන්ධයෙන් ගත් කල, එහි සම්පත් සැලකිය යුතු ප්‍රමානයකින් වැඩිකල යුතු යයි ජී-20 රටවල එකඟතාවය පල වුන ද නව අරමුදල් සැපයීමේ දී කිසිදු ප්‍රතිඥාවක් ලබා දී නැත. මහා බ්‍රිතාන්‍ය මුදල් ඇමතිගේ වචනවලට අනුව ''අපි සංඛ්‍යාවන් පිලිබඳව එකඟතාවක් ඇති කර ගැනීමට බලාපොරොත්තු නොවූයෙමු.''

රැස්ව සිටි ජාතීන් අතර එකඟත්වය සලකුනු කිරීමේ උත්සාහයක නිරත වෙමින් වුව ද, ඒ පිලිබඳව පල කල තමන්ගේ ම වාර්තාව තුල ෆිනෑන්ෂල් ටයිම්ස් පත්‍රයට මෙසේ පිලිගැනීමට සිදුවිය. ''විශේෂිතවූ නව පොරොන්දු කිසිවකින් තොරව රැස්වීම අවසන්වූ අතර, මොන රටකට හෝ මහ බැංකුවකට හෝ ප්‍රකාශනයේ ආලෝකයෙන්, පවත්නා කිසිදු ප්‍රතිපත්තියක් වෙනස් කිරීමට බල නොකල යුතුය.''

එක්සත් ජනපදයේ ඔබාමා පරිපාලනය යුරෝපා

ආන්ඩු මත, විශේෂයෙන්ම ජර්මනිය මත, ඔවුන්ගේ ආර්ථික උත්තේජක සැලසුම් බෙහෙවින් වැඩි කල යුතු බවට සැලකිය යුතු පීඩනයක් යෙදීමත් සමග, ජී-20 සමුලුවට පෙරාතු සතියේ, අත්ලාන්තික් සයුර දෙපස දේශපාලඥයන් අතර උනුසුම් වචන හුවමාරුවනු දැකිය හැකි විය.

බර්ලිනයේ ප්‍රතිචාරය වූයේ, ආර්ථිකයේ ප්‍රතිශත අනුව ගත් කල, ඇමරිකානු ආන්ඩුව විසින් වැය කර ඇති මුදලට සමාන වූ ආකාරයේ උත්තේජක සැලසුම් දෙකක් මේ වන විටත් ජර්මන් ආන්ඩුව හඳුන්වා දී ඇති බව ප්‍රකාශ කිරීමයි. ජර්මානු ආර්ථික රාජ්‍ය ලේකම් වැල්දර් ඔට්‍රිම්බාට අනුව, ''අපගේ වැඩ පිලිවෙලෙහි පරිමාව හා වේගය පිලිබඳව අප ප්‍රසංශාවට බඳුන්ව ඇත. අපට තවත් දේ කිරීම අවශ්‍ය නොවේ.''

ඒ ආකාරයට ම ජර්මනිය පෙරටුකොට ගත් යුරෝපීය ජාතීන්, ජාත්‍යන්තර මූල්‍ය හා ආර්ථික ක්ෂේත්‍රයන්හි දැඩි පරිපාලනයක් සඳහා එක්සත් ජනපදයට එල්ල කල, ඔවුන්ගේ ම ඉල්ලීම් ඉදිරිපත් කලහ.

හෝර්ස්හැම්හි ජී-20 රැස්වීමට පෙර දින බර්ලිනයේ දී, ජර්මන් චාන්සලර්වරිය වන ඇන්ජිලා මර්කෙල් ප්‍රන්ස ජනාධිපති නිකොලායි සර්කෝසි හමුවී ඒකාබද්ධ ප්‍රවිෂ්ටයක් සඳහා එකඟතාවක් ඇති කර ගත්හ. එම හමුවෙන් පසුව සර්කෝසි, විශාල උත්තේජක වැඩ සටහන් සඳහා ඇමරිකාව වෙතින් යෙදෙන පීඩනය බැහැර කිරීමෙහි ලා මර්කෙල් සමග එකඟත්වයකට පැමිනි බව නිවේදනය කලේය. ඔහු මෙසේ පැවසීය. ප්‍රධාන ප්‍රශ්නය ''අනාගතය සඳහා පරිපාලනය මිස තව තවත් වියදම් නොවේ.''

13 දින රාත්‍රියේ බ්‍රිතාන්‍ය අගමැතිගේ පිටිසර නිල නිවස වන චෙකර්ස්හි පැවති කථාබහෙන් පසුව මර්කෙල්, තවත් කුමන හෝ කෙටි කාලීන '' මූල්‍යමය උත්තේජක'' වැඩ සටහන් යලි වතාවක් බැහැර කරමින්, අනාගත පියවර තීන්දු කරන්නේ බර්ලිනයේ දී මිස ජී-20 සමුලුවල දී නොවන බව අවධාරනය කලාය.

ජී-20 රැස්වීමට සහභාගී වූ ප්‍රන්ස මුදල් ඇමති ක්‍රිස්ටීන් ලැගාඩ් විසින් ද මර්කෙල්ගේ ප්‍රකාශ ප්‍රතිරාවය කලේය. දැවැන්ත අතිරේක වියදම් සඳහා නියෝග පැනවීමට පෙර ''අප සෑම අයෙක් විසින් ම දැනට මත් ක්‍රියාවට නංවා ඇති ප්‍රතිකර්ම අගැයීමක් කල යුතුය'' යි ලැගාඩ් ප්‍රකාශ කලේය.

මර්කෙල් හා ලැගාඩ් විසින් කල ප්‍රකාශ පිලිබඳව ඔබ්සවර් පත්‍රය මෙසේ සඳහන් කරයි. ''අප්‍රේල් 3 ජී-20 සමුලුවේ මූලාසනය දැරීමට නියමිත බ්‍රවුන් හා, ගෝලීය ඉල්ලුම පන ගැන්වීමට, ලෝකයේ විශාලම ආර්ථිකයන් විසින් වැඩි සම්බන්ධීකරනයක් සහිත ක්‍රියාමාර්ග ගැනීම අත්‍යවශ්‍ය යයි විශ්වාස කරන එක්සත් ජනපද පරිපාලනයේ ජනාධිපති බරක් ඔබාමා විසින් එක්ව ඇති කර ගත් යෝජනා, ක්ෂනිකව ම මරනයට පත් විය.''

තවත් පැත්තකින් ද වොෂින්ටනයේ මූල්‍ය ප්‍රතිපත්ති පිලිබඳ දැඩි විවේචන මතුව ආවේය. රැස්වීම ආසන්නව තිබිය දී චීන අගමැති වෙන් ජියාබාවෝ, ඩොලර් ට්‍රිලියනයක් යයි ගනන් බලා ඇති චීනය සතු ඩොලර්වලින් නියෝජනය වන එක්සත් ජනපද ආන්ඩුවේ නය, එරට පුලුල් වන නය මගින් තර්ජනයට ලක්ව ඇති බවට අනතුරු ඇඟවීය.

ප්‍රමුඛ ධනපති ජාතීන්ට කිසිදු ඒකාබද්ධ සම්මුතියකට එලඹීමට නොහැකි වීම මගින් පෙන්නුම් කරන්නේ, විශේෂයෙන්ම එක්සත් ජනපදය, යුරෝපය හා චීනය යන ප්‍රධාන බලවතුන් අතර බෙදීම් වේගයෙන් දැඩි වෙමින් තිබෙන බවයි. සති අන්තයේ සිදුවීම්වලින් දැනට මත් පැහැදිලි වී ඇත්තේ, මේ මාසය මුලදී බ්‍රවුන් විසින් වොෂින්ටනයේ දී ඔබාමාට කරන ලද ''ගෝලීය නව සම්මුතිය'' පිලිබඳ යෝජනා කිසිවක් දැන් ඉතිරිව නැති බවයි.

මෙම බෙදීම් දුර දිග යන ඇඟවුම් ගැබ්කර ගනියි. ඇමරිකාව හා ජර්මනිය අතර වර්ධනය වන විභේදනය ගැන සඳහන් කරන මේ සතියේ ඩර් ස්පීගල් පුවත්පතට අනුව ''ඇමරිකානු-ජර්මානු ගැටුම, අර්ථශාස්ත්‍රඥයන්ගේ අම්හිරි මතකයන් අවධි කරයි. 1930 ගනන්වල ලෝක ආර්ථික අර්බුදයේදී ද ඒකාබද්ධ මූලෝපායක් මත එකඟතාවක් ඇති කර ගැනීමට ඇමරිකානු හා යුරෝපීය රාජ්‍යයන් සමත් වූයේ නැත. ප්‍රතිපලය වූයේ ආර්ථික බිඳ වැටීම, අවපාතය තුලට ඇදීයාම වේගවත් කල, ලෝක පරිමාන වෙලඳ යුද්ධයකි. කාර්මික ජාතීන් නොවැම්බර් මස වොෂින්ටනයේ පැවැත්වූ ඔවුන්ගේ ප්‍රථම සමුලුවේ දී ද ප්‍රතිඥා දුන් පරිදි, එවැන්නක් යලි ඇති වීමට ඉඩදිය නොහැකිය. කෙසේ වුව ද දැන්, එක්සත් ජනපදය හා මහාද්වීපික යුරෝපය අතර බෙදීම් වර්ධනය වෙමින් පවතියි.''

1930 ගනන් කරා සමාන්තරයක් අඳින ඩර් ස්පීගල්, ජර්මනිය හා එක්සත් ජනපදය ද ඇතුලු එහි එදිරිවාදීන් අතර ගැටුම පිලිබඳ යෝජනා කුලු ගැන්වුනේ, දෙවන ලෝක සංග්‍රාමයෙන් ය යන කාරනය නොසලකා හරියි.

© www.wsws.org